# 23

# සෞන්දර්ය විද්‍යාව, ලස්සන හා ප්‍රාසංගික කලා අතර සම්බන්ධය

*ජ්‍යෙෂ්ඨ විශදාපක මහාචාර්ය දයා එදිරිසිංහ*

## සෞන්දර්ය විද්‍යාවේ ස්වභාවය.

සෞන්දර්ය විද්‍යාවේ ස්වභාවය පිළිබඳ ව ඉතා දීර්ඝ විග්‍රහයක් පෙරපර දෙදිග ලේඛකයන් විසින් ඉදිරිපත් කරනු ලැබ තිබේ. එහි දී ඉදිරිපත් වූ ප්‍රබල මතයකි, සෞන්දර්ය විද්‍යාව කලාව පිළිබඳ සහ ඒ පිළිබඳ ඇගයුම් කරන විද්‍යාවක්ය යන්න. 1712 දී ජෝශප් ඇඩිසන් නමැති ලේඛකයා විසින් The Spectator නම් සඟරාවට ලියූ ලිපියක් මගින් ගෘහ නිර්මාණ ශිල්පය හා සාහිත්‍ය පිළිබඳ අවධානය යොමු කළ බව දක්නට ලැබේ. 18වන සියවසේ දී පමණ සෞන්දර්ය විද්‍යාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ බව පැහැදිලිය. 18වන සියවසේ දී විනෝදාස්වාද මාධ්‍ය බිහි වූ අතර ඒ මගින් සෞන්දර්ය ක්ෂේත්‍රය පිළිබඳ ව නව ආකල්ප ගොඩනැගුණි. මේ සියවසේ ජීවත් වූ ජර්මන් ජාතික ඉමැනුවෙල් කාන්ට් නමැති දාර්ශනිකයා මේ සම්බන්ධ ව ගැඹුරු අදහස් ඉදිරිපත් කළ අයෙකි. මොහු ප්‍රථමයෙන් ම රූපිකවාදියෙකු ලෙස විශ්වාස කළ ද එය ඇතැම් දෙනාගේ විරෝධයට හේතු විය. කාන්ට්ගේ මතය අනුව සෞන්දර්ය ක්ෂේත්‍රයේ ඉදිරිපත් කෙරෙන්නේ සංකල්පයන්ය. එසේ ම කලාව විනෝදාස්වාදය සඳහා කැපවී ඇති ක්ෂේත්‍රයකි. මෙම අදහස් සමග කාන්ට්ගේ සෞන්දර්ය විද්‍යාත්මක මත යුරෝපය පුරා ප්‍රචලිත වූ බව පෙනේ. සෞන්දර්ය විද්‍යාව පිළිබඳ විවිධ නිර්වචන හා මතවාද රාශියක් බිහිවී තිබේ. එක් මතයකට අනුව “ලස්සන සදාචාරයේ සංකේතයකි.” (Beauty is a Symbole of Morality) තවත් තැනෙක කලාව වනාහී ජීවිතයට සම්බන්ධ කරගත් විට එය සදාචාරය ලෙස පෙනෙන බව, එනම් කලාව වූකලී සදාචාරය ඉස්මතු කරන සංකේතයක් බව දක්වේ. එනම් “ස්වභාව සෞන්දර්ය ආස්වාදය ආත්මයේම කොටසකි.” (The enjoyment of nature is the mark of a good soul) යනුවෙනි. සෞන්දර්ය ක්ෂේත්‍රය පිළිබඳ ව ප්‍රකාශ කරන එඩ්මන් බර්ක් මෙසේ පවසයි. "Philosopical enquiry in to the origin of our idea of the sublime beautiful" මෙම අදහස පසුකාලීන ව උගතුන්ගේ දැඩි සාකච්ඡාවට භාජනය විය. මෙහි සඳහන් ලස්සන හා උත්කෘෂ්ට බව යන වචන දෙක විසිවන සියවස තුළ සෞන්දර්ය විද්‍යාව මැනවින් නියෝජනය කරයි.



1959 දී ෆ්‍රෑන්ක් සිඩ්ලි නම් ලේඛකයා පවසා ඇත්තේ, සෞන්දර්ය ක්ෂේත්‍රයේ බලපවත්නා රීති හෝ කොන්දේසි නොමැති වුවත් අනිවාර්යයෙන් ම එහි දී කරුණු කිහිපයක් වැදගත් වන බවයි. එනම් ප්‍රත්‍යක්ෂය යන වචනයයි. සමහරෙක් මෙය රසය වශයෙන් ද දක්වති. කෙසේ නමුත් සංවේදී බව, විනිශ්චය, දඩබ්බර, අහිංසක, හාස්‍යෝත්පාදක, විනෝදාත්මක වැනි සමහර වචන ද මේ සඳහා යොදන නමුත් ඒවා යෝග්‍ය නොවන බව සිඩ්ලිගේ අදහසයි. කාන්ට් පවසන ආකාරයට වෛශේෂිකත්වය හා විශ්වසනීයත්වය කලාවට බෙහෙවින් වැදගත් ය.

ෆ්‍රැන්සිස් හච්සන් නමැති ලේඛකයා පැවසුවේ “විවිධත්වයේ ඇති ඒකාබද්ධතාව යම් දෙයක් ලස්සන කරන බවයි.” (Unformity in Varity always makes and object beautiful) යනුවෙනි. සැබවින් ම ලෝකය ලස්සන වන්නේ මිනිසුන්ගේ විවිධත්වය මත නොවේ ද? මෙය අප වටහා ගත යුතු වටිනා අදහසකි.

ඩේවිස් හිං, 1757 දී Of the Standered of Taste කෘතිය ආශ්‍රයෙන් කලාව සම්බන්ධ හොඳ නිමැවුම් සහ නරක නිමැවුම් පිළිබඳ අදහස් ඉදිරිපත් කළේය. එඩ්වඩ් බුලෝ නම් ලේඛකයා ආශාවක් ඇති නොවන අවධානයෙන් සහ දුරස්ථ ආකල්ප යන වචන දෙක ඇසුරෙන් ඉහත අදහස පැහැදිලි කරයි. ඔහු ඇතැම් තැනෙක Over Distence සහ Under Distence යන වචනයන්ගෙන් යම්කිසි තිබෙන සීමාවකට වඩා වැඩි සහ තිබෙන සීමාවකට වඩා අඩු සීමාවක් යන්න අදහස් කරයි. මෙහි දී කලා කෘතියකට ළඟා නොවන අතර අවශ්‍ය දේ කතා නොකර සිටී. කලා කෘතියක සමස්ත නිර්මාණය පිළිබඳ තිබෙන පොදු ඇගයුම ඉතා වැදගත්ය. ඩිකී නමැති ලේඛකයා පවසන්නේ කලා කෘතියක දී මනෝවිද්‍යාව ද අවශ්‍ය වන බවයි. විනෝදාස්වාදය ඇති කිරීමේ මාධ්‍ය වශයෙන් කලා ක්ෂේත්‍රය පමණක් නොපිළිගන්නා බොහෝ ලේඛකයෝ විවිධතාවන්, ක්‍රීඩා යනාදිය ද ඊට ඇතුළත් වන බව පවසති. වෑස්ට් නමැති ලේඛකයා පවසන්නේ ක්‍රීඩාව චරිත සංවර්ධනයට හා සදාචාර සංවර්ධනයට ඉවහල් වන බවයි.

එසේ ම සෞන්දර්ය විද්‍යාව පිළිබඳ නව අදහස් රාශියක් මෑතකදී ඉදිරිපත් වී ඇත. ඇරිස්ටෝටල් පැවසුවේ “කලාව යනු හැඟීම්හි පරිශෝධනය බවයි” අවුල් වී ඇති මිනිස් හැඟීම් පිරිසිදු කර එක් අරමුණක් කරා ගෙන ඒම කලාවේ පරමාර්ථයයි. ඔහු Catharsis යන්නෙන් මිනිස් සිත්වල ඇති නරක දේවල් ඉවත් කිරීම හෙවත් භාව ශෝධනය ලෙස දක්වා ඇත.

නිර්මාණ සඳහා පාදක වන පරිකල්පනයට කලාවේ වැදගත් තැනක් හිමි වේ. කලා කෘතීන්හි ඇති උසස් භාවය ආරක්ෂා කර ගැනීමට ප්‍රයත්න දරන්නේ එමගින් ලැබෙන සතුට අරමුණු කරගෙන ය. එහි දී රසය (Taste) සහ මනෝභාවයට (Sentiment) ප්‍රබල තැනක් හිමි වේ.

උපස්ථිතිවාදී න්‍යාය ඉදිරිපත් කරනු ලැබූ විසිවන සියවසේ දාර්ශනිකයන් කියා සිටින්නේ මෙය සමස්ත සිදුවීමේ එක් පැත්තක් බවයි. කෙසේ නමුත් මෙහි දී සෞන්දර්යවාදීන් විසින් කලාව හඳුන්වා දීමට මෙබඳු නිර්වචනයක් භාවිත කරනු ලැබේ. එනම් කලාව වඩා වේගයෙන් අපූර්වජනක අත්දැකීම් ලැබිය හැකි මාධ්‍යයක් බවයි. උපස්ථිතිවාදී න්‍යායයෙන් පැහැදිලි වන්නේ ඔවුන් ආවේගශීලී මානසික ක්‍රියාදාමයකට ප්‍රවේශ වුව ද ඔවුන්ගේ රසවාදය පිළිබඳ හැඟීම තව දුරටත් වෙනස් වීමට ඉඩ ඇති බවයි. කෙසේ නමුත් උපස්ථිතිවාදීන්ගේ පැරණි මතය අනුව නම් සමාජයේ පවත්නා බොහෝ දේ විකසිත කර ගැනීමට කලා මාධ්‍ය යොදාගත හැකි බවයි. 1930 දී ආර් කොලින්වුඩ් නමැති ලේඛකයා කලාව ස්වයං ප්‍රකාශනයක් බව දක්වමින් පවසන්නේ, "අපි මනඃකල්පිත අත්දැකීමක් හෝ ක්‍රියාවක් නිර්මාණය කරන අවස්ථාවේ දී අපේ හැඟීම් ප්‍රකාශ කරන අතර එය කලාව නිසා හඳුන්වා දෙන බවය."

කාල් මාක්ස් ප්‍රමුඛ අනුගාමිකයෝ කලාව පිළිබඳ ව ඓතිහාසික තත්ත්වය යටතේ විමසා බැලූහ. ඔවුන් පැවසුවේ කලාව සමාජයේ සමකාලීන ආර්ථිකය හා සමාජ තත්ත්වය විදහා පාන්නක් බවය. ලියෝ තෝල්ස්තෝයි නමැති රුසියානු ලේඛකයා පැවසුවේ මෙයට වෙනස් අදහසකි. ඔහුගේ අදහස් පශ්චාත්කාලීන රුසියානු විප්ලවය කෙරෙහි ද බලපෑම් කර ඇත.

විසිවන සියවසේ කලාව හා සෞන්දර්ය පිළිබඳ මත මීට වඩා හාත්පසින් ම වෙනස් විය. ඔවුන් විසින් අනර්ඝ, ආකර්ශනීය, දුර්ලභ, අභිමානවත් හා කදිම යන ඇගයුම් ද ඒකගත්වය, ඒකමුතුව, විවිධත්වය හා සංකීර්ණත්වය වැනි ඇගයුම් ද මේ සඳහා යොදන ලදී. තාක්ෂණික වශයෙන් යොදන නිගමන වන හොඳ නිර්මාණ, කුසලතා පූර්ණ හා වෘත්තීමය යන පද ද මෙහිදී භාවිත කෙරිණ. ග්‍රීසියෙහි මේ සඳහා Techne යන පදය භාවිත කර ඇත්තේ තාක්ෂණික අවශ්‍යතාවන් සපුරා ගැනීම උදෙසාය.

## ලස්සන යනු කුමක්ද?

බටහිර සෞන්දර්යය විද්‍යා ක්ෂේත්‍රයෙහි ඉතා විශාල විප්ලවයක් ඇති කරනු ලැබූ ග්‍රන්ථයක් ලෙස 1923 දී පළ කරන ලද The Meaning of Meaning නමැති ග්‍රන්ථය දැක්විය හැකිය. වාග් විද්‍යාව, සෞන්දර්යය විද්‍යාව භාෂාව පිළිබඳ නව මත වාදයන් රාශියක් ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම ග්‍රන්ථය මහත් විප්ලවයක් සිදු කරනු ලැබූ බව පෙනේ. මෙම ග්‍රන්ථයට පෙරවදනක් සැපයූ එහි කර්තෘවරුන්ගේ අපේක්ෂාව වූයේ, සංකේතවාදය පෙරමුණු කොටගත් නව දාර්ශනික අර්ථකථනයක් එමගින් ඉදිරිපත් කිරීමයි. එම ග්‍රන්ථය ඉදිරිපත් කරනු ලැබූ ශබ්දාර්ථවාදය වාග් විද්‍යාව හා භාෂාව පිළිබඳ ව ඉදිරිපත් කළ නව මත බොහෝ



දෙනාගේ අවධානයට පාත්‍ර විය. මෙම ග්‍රන්ථයේ පෙරවදනට ඉදිරිපත් කළ අර්ථකථනයේ Umberto Eco නමැති ඉතාලි ජාතික ලේඛකයා මෙම ග්‍රන්ථය කාරණා තුනක් මත වැදගත් වන බව පෙන්වීය. එනම් මේ ග්‍රන්ථයෙන්,

1. සම්භාව්‍ය ග්‍රන්ථ පිළිගැනීම
2. සමකාලීන බලපෑම පිළිගැනීම
3. කියවීමට ආශාවක් ඇතිවීම

පැහැදිලි වීමයි. ලස්සන යන්න සෞන්දර්ය ක්ෂේත්‍රයේ එන කේන්ද්‍රීය තේමාවකි. එයට හිමි වන ස්ථානය අද්විතීයයි. ලස්සන යන්න කවරාකාරයකින් ගොඩනැගෙන්නේ ද යන්න පිළිබඳ ව ඉදිරිපත් කළ මතවාද පහත පරිදි දැක්විය හැකිය.

I. ඕනෑ ම දෙයක් ලස්සනයි! එහි සරල ලස්සන නමැති ගුණාංගය අන්තර්ගත නම්
II. ඕනෑ ම දෙයක් ලස්සනයි! එහි සුවිශේෂ සැකස්ම අනුව
III. ඕනෑ ම දෙයක් ලස්සනයි! එය ස්වභාවධර්මයට අනුරූප නම්
IV. ඕනෑ ම දෙයක් ලස්සනයි! සාර්ථක ලෙස මාධ්‍ය භාවිතයට ගෙන ප්‍රතිඵල ලබාගත හැකි නම්
V. ඕනෑ ම දෙයක් ලස්සනයි! ප්‍රතිභා සම්පන්න පුද්ගලයෙකුගේ නිර්මාණයක් නම්
VI. ඕනෑ ම දෙයක් ලස්සනයි! සත්‍ය, ස්වභාවධර්මීය හරය, පරමාදර්ශීය බව විශ්වීය සංකල්ප, සුවිශේෂ නිමැවුමක් එහි ඇත්නම්
VII. ඕනෑ ම දෙයක් ලස්සනයි! මායාව ඉදිරිපත් කරන්නේ නම්
VIII. ඕනෑ ම දෙයක් ලස්සනයි! එමගින් ඉතා හිතකාමී සමාජ බලවේග ගොඩනැගෙන්නේ නම්
IX. ඕනෑ ම දෙයක් ලස්සනයි! එහි හැඟුම් ප්‍රකාශ කරන ආකාරය අනුව
X. ඕනෑ ම දෙයක් ලස්සනයි! සතුට ප්‍රකාශ කිරීමට හේතුවේ නම්
XI. ඕනෑ ම දෙයක් ලස්සනයි! අපගේ හැඟීම් උද්දීපනය කරන්නේ නම්
XII. ඕනෑ ම දෙයක් ලස්සනයි! සුවිශේෂ හැඟීම් වර්ධනය කරන්නේ නම්
XIII. ඕනෑ ම දෙයක් ලස්සනයි! සහකම්පනයෙන් තවත් අයෙකුගේ හැඟීම් අවබෝධ කරගත හැකි නම්
XIV. ඕනෑ ම දෙයක් ලස්සනයි! එහි වැදගත්කම වර්ධනය කරන්නේ නම්
XV. ඕනෑ ම දෙයක් ලස්සනයි! අතිවිශේෂ පෞරුෂත්වයක් සමග අප සහසම්බන්ධ වන්නේ නම්
XVI. ඕනෑ ම දෙයක් ලස්සනයි! වාද ප්‍රතිවාද එකට ගැටී සහවාද ගොඩනැගෙන්නේ නම්

මෙම සමස්තය ආශ්‍රයෙන් කලා කෘතියක අන්තර්ගත විය යුතු ගුණාංග රාශියක් හඳුනාගත හැක. දාර්ශනිකයන්, ඉතිහාසඥයන් හා මනෝවිද්‍යාඥයන් සඳහන් කරන ආකාරයට ගැඹුරු මනෝභාවමය උද්දීපනයක් සෞන්දර්ය විද්‍යාව මගින් සිදුවිය යුතුය. ලස්සන, මනෝභාවයන් හා ඍජු සම්බන්ධතාවක් ඇත්තකි. එනිසා එය අනිර්වචනීය පදයකි.

මෙම ලස්සන යන්න උසස් කලා කෘතිවල අන්තර්ගත ව පවතී. එය කොතන ද කෙසේ ද යන්න අපගේ ස්වාභාවික භාෂා පදවලින් විස්තර කිරීම අතිශයින් ම දුෂ්කර කටයුත්තකි. මෙම ප්‍රහේලිකාවට පිළිතුරු දීමට උසස් වින්දනයක් අපගේ මනස තුළ වර්ධනය වී පැවතිය යුතුය.

## ප්‍රාසංගික කලා හා දෘශ්‍ය කලා අතර වෙනස

කලා ක්ෂේත්‍රයන් පිළිබඳ ව විමසා බැලීමේ දී ප්‍රාසංගික කලාව හා දෘශ්‍ය කලාව අතර පවතින වෙනස හඳුනා ගැනීම විශේෂය. මෑතක දී වඩාත් ජනප්‍රියත්වයට පත්වූවක් ලෙස දෘශ්‍ය කලා හැඳින්විය හැකි අතර ප්‍රාසංගික කලා බොහෝ කලකට පෙර සිට ජනප්‍රියත්වයට පත් ව තිබුණි. කලාකරුවාගේ ශරීරය, මුහුණ මාධ්‍යයන් කොටගෙන ප්‍රාසංගික නිර්මාණ ඉදිරිපත් කිරීම ප්‍රාසංගික කලාවෙහි දී සිදුකෙරෙන අතර ඒ සඳහා ලෝහ, මැටි, වර්ණ භාවිත කරමින් එය භෞතිකමය කලා ස්වරූපයෙන් නිර්මාණය කෙරේ. ප්‍රථම වරට Performing Art යන වචනය 1711 දී භාවිත විය. ප්‍රාසංගික කලා ගණයට සරඹ ආශ්‍රිත නිර්මාණ, හාස්‍යෝත්පාදක නිර්මාණ, නැටුම්, මායා සංදර්ශන, සංගීතය, ඔපෙරා, චිත්‍රපට, නාට්‍ය සහ සර්කස් කලාව හඳුන්වාදිය හැකිය.

ප්‍රාසංගික කලාවෙහි ඉතා වැදගත් ස්ථානයක් සංගීතයට හිමිවී ඇත. එසේ ම ග්‍රීක තියෙට්‍රෝන් නමැති පදයෙන් බිහිවූ Theatre යන්නෙන් අදහස් කරන්නේ ප්‍රාසංගික කලා ක්ෂේත්‍රයට ඉතා වැදගත් වන මෙහි අතර කථාවක් පාදක කොටගෙන සිදුකරන රඟපෑම වැදගත් වේ. සාම්ප්‍රදායික ඉන්දියානු නැටුම්, චීන, ඔපෙරා සහ මුද්‍රා නාට්‍යන්හි අභිරූපණය දක්නට ලැබේ. මෙයට උදාහරණ ලෙස කබුකි නාට්‍ය දැකිය හැකිය. නර්තනය ද ප්‍රාසංගික කලාවෙහි වැදගත් අංගයකි. නර්තනය ඇතැම් විට සමාජමය හා ආධ්‍යාත්මික වශයෙන් වැදගත් වන පරමාර්ථ දැක්වීමට මෙන් ම සුවිශේෂ ප්‍රාසංගික පසුබිමක් තුළ ද දැකිය හැකිය. ඇතැම් විට නර්තනයන්හි අවාචික සංනිවේදනය දක්නට ලැබේ. සටන්කලා ක්‍රම සහිත සංදර්ශන, ජිම්නාස්ටික් ක්‍රීඩා, හිම මත ලිස්සීම, පිහිනීම, වැනි නිර්මාණය ද නර්තනය හා සංගීතය සමග ඒකාබද්ධ ව පවතී.

ග්‍රීක සම්භාව්‍ය ප්‍රාසංගික කලා ක්ෂේත්‍රයේ දී ඉතා ම සම්භාවනීය පුද්ගලයෙකු ලෙස සොපොිලිස් නම් කළ හැකිය. මෙම නාට්‍යකරුවා විසින් නර්තනය මිශ්‍රිත නාට්‍ය රචනා කොට ඇත. විශේෂයෙන් ම



යුරිපිඩිස් නමැති නාට්‍ය මෙයට උදාහරණය. මෙම අවධියේ කොමඩි නාට්‍ය ඉතා වැදගත් තැනක් හිමිකර ගත්තේය. එසේ නමුත් මධ්‍යකාලීන අවධියේ මෙම නාට්‍යවල අභාවය සිදුවූ අතර ශතවර්ෂ දහයකට අධික කාලයක් පල්ලියේ බලපෑම නිසා කලාව සෑහෙන දුරට යටපත් වූ අතර ශුද්ධවන්ත හා වෙනත් වැදගත් ආගමික දිනවල දී පමණක් මෙවන් කලා නිර්මාණ ඉදිරිපත් විය. 15වන සියවසේ දී ඉතාලියෙහි ප්‍රාසංගික කලා යුරෝපය පුරා ප්‍රචලිත විය. ඔවුන් විසින් Pallo නමින් ප්‍රථමයෙන් හඳුන්වා දුන් Danza හෙවත් Dance පදය නැටුම් යන්නට භාවිත කෙරිණ. පසු ව බැලේ (Bellet) යන්න Belletti, Balli යන ලතින් පදවලින් බිහිවී යුරෝපයේ ප්‍රචලිත විය. 16 වන සියවසේ දී Commidia Bellati හෙවත් හාස්‍යෝත්පාදක නාට්‍ය යුරෝපයේ ප්‍රචලිත විය. විශේෂයෙන් ම 16වන සියවසේ එංගලන්තයේ මහා නාට්‍යකරුවෙකු ලෙස ප්‍රචලිත විලියම් ෂේක්ශ්පියර් විසින් සංගීතය ද නැටුම් සඳහා භාවිතයට ගෙන ප්‍රාසංගික කලා ක්ෂේත්‍රය පෝෂණය කළේය. 1957 දී ප්‍රථම ඔපෙරාව ඉදිරිපත් කරන ලදී. මෙය යුරෝපයේ වංශවත් සිටුවරුන් සඳහා පැවැත්විණි. පසු ව මේ සඳහා යුරෝපීය නගරවල ජීවත් වූ විශාල පිරිසක් ද සහභාගි විය.

### ආශ්‍රිත ග්‍රන්ථ

1. Bowra, C.M., 1968, Greek Literature, Sphere Hamondswonth, Penguin.
2. Ogdan, C.K., & Richards, I.A., 1923, The Meaning of Meaning
3. Perter, A., 1975, Philosophical Explorations, General Learning Press, New Jersey.
4. Roland , B., 1977, Images, Music, Text Hill and Wang, New York.
5. Warpurton N., 1992, Philosophy, The Basis, Routledge, London.
6. Wolheim, R., 1980, Art and its objects, Cambridge University Press, Cambridge.